# පේළි හයේ ඩ්‍රම් සීඩරය/බීජ වී වප්කරය

වී ගොවිතැනේදී ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුව, කම්කරු ශ්‍රම හිඟය සහ ශ්‍රමය යෙදවීම වෙනුවෙන් වැය කිරීමට සිදුවන අධික පිරිවැයයි. මෙම අධික පිරිවැය දැරිය නොහැකි තත්වය හා වියදමට සරිලන ලාභයක් නොලැබීම නිසාම වී ගොවීන් දැඩි අසීරු තත්වයකට පත්වී ඇත.

වී ගොවිතැනින් ප්‍රමාණවත් ලාභයක් ලැබීමට නම් නිෂ්පාදන පිරිවැය පහත හෙලීම කලයුතුව ඇත. නිෂ්පාදන පිරිවැය අඩුකර වී ගොවිතැන ලාභ ලබන කර්මාන්තයක් බවට පත්කල හැකි සුදුසුම ක්‍රමය වී වගාව යාන්ත්‍රීකරණය කිරීමයි.

කෘෂි යාන්ත්‍රීකරණය පිළිබඳව පර්යේෂණ සිදු කරමින් ක්ෂේත්‍ර ආදර්ශන ප්‍රායෝගිකව සිදුකරන රජයේ එකම ආයතනය මහඉලුප්පල්ලම ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානයයි. බීජ වී පේළියට වැපිරීම සඳහා නිර්මාණය කරන ලද බීජ වී වප්කර අතරින් පේළි හයේ ඩ්‍රම් සීඩරය වී පේළියට වැපිරීම සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද යන්ත්‍රයකි.

(1) රූපය



පේළි හයේ බීජ වී වප්කරය

# ඩ්‍රම් සීඩරය භාවිතයේ වාසි

1. අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය අඩුවීම (අක්කරයකට කි.ග්‍රෑම් 15-20 අතර)

2. දිනකට අක්කර 2-3 පමණ  ප්‍රමාණයක් මිනිස් ශ්‍රමයෙන් අතින් ඇදගෙන යාම මඟින් එක් අයකුට පහසුවෙන් ක්‍රියාකල හැකිවීම

3. තවානක් අවශ්‍ය නොවීම සහ තවානක් නඩත්තු කිරීමට යන කාලය, ශ්‍රමය, වියදම සම්පූර්ණයෙන්ම ඉතිරි කර ගත හැකිවීම

4. තවානෙන් පැළ ගලවා සිටුවීමේදී පැළවල මූල මණ්ඩලයට සිදුවන හානි සහ පත්‍රවලට හානි වීමෙන් සිදුවිය හැකි රෝග ආසාදන සහ වර්ධනය බාලවීමේ අවදානම් තත්වයන් ඇති නොවීම

5. වගා ක්ෂේත්‍රය පුරාම පේළි හා පැළ අතර ඒකාකාරී පරතරයක් ඇතිව බීජ වැපිරීම අවසන් වනතුරුම සිදු කල හැකි නිසා ක්ෂේත්‍රය සහ බීජ අපතේ නොයෑම

6. බිත්තර වී නිෂ්පාදනයේදී මුහුන් පැළ ඉවත් කිරීම පහසුවීම

7. යාන්ත්‍රිකව වල් මර්ධනය කලහැකි නිසා රසායනික වල් නාශක සඳහා යන වියදම අඩුවීම සහ පරිසර දූෂණය නොවීම මෙන්ම ශාකයට පොහොර ඇද ගැනීමේ කාර්යක්ෂමතාවය වැඩිවීම



2 රූපය
යාන්ත්‍රිකව වල් මර්ධනය කරන ලද වගාවක්

8. පේළි හා පැළ අතර ඒකාකාරී පරතරයක් ඇති නිසා හොඳින් වාතාශ්‍රයත් හිරු එළියත් ලැබීමෙන් යහපත් පරිසර තත්වයක් ඇති වගා ව්‍යුහයක් තුළ වර්ධනය වන ශාක ශක්තිමත්ව වැඩෙන බැවින්, කීඩෑ උවදුරු සහ වෙනත් රෝග වලට ගොදුරු වීම අඩුවීම මෙන්ම රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිවීම



පේළි අතර මෙන්ම පැළ අතරද ඒකාකාර පරතරයක් රඳවා ගත හැකි වීම

3 රූපය

9. පේළි සහ විශේෂයෙන් පැළ අතර සමාන පරතරයක් ඇතිව ක්‍රමානුකූලව බීජ වැපිරීම සිදු කල හැකි නිසා ක්ෂේත්‍රය පුරාම සමාකාරව පැළ වර්ධනයවීමෙන් නියමිත කාලයට වගාවේ නඩත්තු කටයුතු කාර්යක්ෂමව ඵලදායි ලෙස සිදුකිරීමට හැකි වීමෙන් සාර්ථක අස්වැන්නක් ලබා ගත හැකි වීම

10. හොඳින් පඳුරු ගැසීම නිසා අහිතකර කාලගුණික තත්වයන්හිදී කරලින් බරවූ ගොයම ඇදවැටීමෙන් වැළකීම සහ ක්ෂේත්‍රයේ ගොයම් කැපීමට යන්ත්‍ර භාවිතා කිරීමට පහසු විම



ඒකාකාර පරතරය නිසා ගොයම හොඳින් පඳුරු ගසයි

4 රූපය

ඩ්‍රම් සීඩරය භාවිතා කර වී බීජ පේළියට වැපිරීම මඟින් කාලය, ශ්‍රමය, වියදම අඩුකර ගතහැකිවීම මෙන්ම ගුණාත්මක බවින් වැඩි අස්වැන්නකුත් කාර්යක්ෂමතාවය වැඩි නිසා අඩු ශ්‍රමයක් වැයවීම මඟින්  වැඩි ලාභයක් ලැබීමට හැකිවීම විශේෂ වාසියකි.

## බිම් සැකසීම

සීඩරය භාවිතා කිරීම වෙනුවෙන් විශේෂ බිම් සකස් කිරීමක් අවශ්‍ය නොවේ. සාමාන්‍යයෙන් වී වැපිරීම සඳහා සකස් කරන ආකාරයට බිම් සැකසීම ප්‍රමාණවත්ය.

## භාවිතා කල හැකි වී වර්ග හා ප්‍රමාණය

ඕනෑම වී වර්ගයක් භාවිත කළ හැකි අතර අක්කරයකට කිලෝග්‍රෑම් 15-20 පමණ ප්‍රමාණයක් යෙදීම ප්‍රමාණවත්ය.

## බීජ වී සැකසීම

යන්ත්‍රය සඳහා බීජ වී සැකසීම සිදු කෙරෙන්නේ සාමාන්‍යයෙන් වී වැපිරීමේදී බීජ වී සැකසීම සිදුකරන අන්දමටය. නමුත් දිනකට වඩා කනු කැපුණ වී යන්ත්‍රය සඳහා සුදුසු නොවේ. දිගට වැඩුනු මුල්, බීජ ඒකාකාරව වැටීමට බාධා ඇති කරයි.

## යන්ත්‍රය භාවිතය

යන්ත්‍රයේ කුටීර තුළ ඇති කවුළු මඟින් බීජ යන්ත්‍රය තුළට ඇතුල් කෙරේ. බීජ වී පුරවන ලද යන්ත්‍රය ලියද්දේ කානු දමා ඇති අතට විරුද්ධ අතට ඇදගෙන යාම මඟින්, එකවර පේළි 6කට බීජ වී යෙදීම සිදුකල හැක.

මෙහි ඇති විශේෂත්වය වන්නේ පේළි අතර මෙන්ම පැළ අතරද ඒකාකාර පරතරයක් පවත්වා ගත හැකි වීමයි. පේළි අතර සෙ. මී. 20ක්ද (අඟල් 8ක් පමණ) පැළ අතර සෙ.මී.8ක් පමණ (අඟල් 3ක් පමණ) පරතරයක් පවත්වා ගත හැක.



## වගාව නඩත්තු කිරීම

දිනක් පමණ කනු කැපුණු වී බීජ ක්ෂේත්‍රයේ ස්ථාපනය කිරීමෙන් පසු ක්ෂේත්‍රය වියලිව පවතීනම් දින තුනකින් පමණ ලියදි තෙමෙන ලෙස ජලය බැඳ කපා හැරීම කල හැක. ඉන්පසු දින තුනක් පමණ ගතවූ විට සාමාන්‍ය ලෙස ජලය බැඳ තැබීම කල හැක.

මූලික පොහොර යෙදීමෙන් පසු සති 2ක් ගත වූ විට එනම් දින 14න් පළමු පොහොර යෙදීම සිදුකර, කෝනෝවීඩර යොදා වල් මර්ධනය කරන අතර ඉන් සති 2කට (දින 14කට) පසු දෙවන මතු පිට පොහොර යෙදීම සිදුකර, දෙවන වතාවටද වීඩරය යොදා වල් මර්ධනය කර ගත හැක. ඉන්පසු සාමාන්‍ය වී වගාවක් ලෙසම වගාව නඩත්තු කළහැක.

## යන්ත්‍රය නඩත්තු කිරීම

ඉතා සරළ යන්ත්‍රයක් බැවින් නඩත්තුවක් අවශ්‍ය නොවන තරම් වේ. භාවිතයෙන් පසු ඉතිරි බීජ වී යන්ත්‍රයෙන් ඉවත් කොට මඩ සෝදා වියලිව තබා ගැනීම ප්‍රමාණවත් වේ.

*අපගේ ප්‍රමිතීන්ට අනුකූලව නිපදවන ලද මෙම යන්ත්‍රය පහත සඳහන් නිෂ්පාදකයින් වෙතින් මිලදී ගත හැක.*

*නිව් සිටි ෆයිබර් ග්ලාස්,*
*කුරුණෑගල පාර,*
*කන්දෙකුඹුර,*
*ගලගෙදර.*
*දු. අං. : 081-2460192*

*ඩොල්ෆින් ෆයිබර් වර්ක්ස්,*
*උඩදිගන හන්දිය,*
*පුත්තලම් පාර,*
*කුරුණෑගල.*
*දු. අං. : 037-4692081*

*අනුග්‍රහය : ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය*

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya.
Printed by: AGRICULTURE PRESS, Gannoruwa.

**මහඉලුප්පල්ලම ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය හඳුන්වාදෙන**

# පේළි හයේ බීජ වී වප්කරය



*විස්තර සඳහා :*
*නියෝජ්‍ය අධ්‍යක්ෂ,*
*ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය,*
*මහඉලුප්පල්ලම.*
*දු. අං. : 025-2249222 Fax: 025-2249222*